# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/2 - 2013 ජූලි මස 15 වැනි සඳුදා - 2013.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත)**

3(4) වැනි උපවගන්තිය යටතේ වූ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3(4) වැනි උපවගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මා විසින්, මෙම නිවේදනය මගින්,

(1) ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති සෙන්ට්‍රල් ලැන්කෂර් විශ්ව විද්‍යාලයට අනුබද්ධිත විශ්ව විද්‍යාල ශාඛාවක් බස්නාහිර පළාතේ, මීරිගම අපනයන සැකසුම් කලාපයේ පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතියට අදාල තොරතුරු සඳහන් නිවේදනය 2013 පෙබරවාරි මස 06 වැනි දින අංක 1796/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බවත්,

(2) ඉහත කී යෝජිත විශ්ව විද්‍යාලයට අනුබද්ධිත විශ්ව විද්‍යාල ශාඛාව, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ අන්තර්ගත ප්‍රතිපාදනයන්ට අනුකූලව, අදාල ව්‍යාපෘතිය, සමාගම විසින් එකී විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යා යුතු බවත්, මෙම ව්‍යාපෘතිය ජාතික වැදගත්කමක් හිමිවන රටට ආර්ථික, සාමාජීය ප්‍රතිලාභ හිමිකර දෙන ව්‍යාපෘතියක් බවටත් සහතික කළ යුතු බවත්,

(3) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති සෙන්ට්‍රල් ලැන්කෂර් විශ්ව විද්‍යාලයට අනුබද්ධිත විශ්ව විද්‍යාල ශාඛාවක් බස්නාහිර පළාතේ, මීරිගම අපනයන සැකසුම් කලාපයේ පිහිටුවා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියට පනතේ (3) වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත්,

(4) ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය "සෙන්ට්‍රල් ලැන්කෂර් විශ්ව විද්‍යාලයට අනුබද්ධිත විශ්ව විද්‍යාල ශාඛාවක් බස්නාහිර පළාතේ, මීරිගම අපනයන සැකසුම් කලාපයේ පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය" ලෙස හඳුන්වනු ලැබිය යුතු අතර සීමාසහිත යූක්ලැන් පුද්ගලික සමාගම ව්‍යාපෘති සමාගම වන බවත්,

(5) ඉහත කී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු 2012 දෙසැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් දිනයේ සිට අවුරුදු දහයක් (10) ඇතුළත අදියර හතරකින් ඇරඹිය යුතු බවත්,

1A - PG 1683— 710 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(6) මෙම නියමයේ උපලේඛනයේ සඳහන් නිදහස් කිරීම්, එහි සඳහන් කර තිබෙන්නාවූ සීමාවන්වලට යටත්ව ව්‍යාපෘති සමාගමට අදාළ විය යුතු අතර එහි සඳහන් කාල සීමාව තුළ බලාත්මක විය යුතු අතර එකී නිදහස් කිරීම් 2012 දෙසැම්බර් මස 13 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරමි.

**උපලේඛනය**

(අ) *2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (සංශෝධිත)*

(i) වසර පහළොවක (15) කාලසීමාවක් සඳහා ව්‍යාපෘති සමාගමේ බදු ගෙවිය යුතු ලාභය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලින් නිදහස් වේ ("බදු නිදහස් කාලය"). එකී වසර දහය (10) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසරකට (01) කාලපරිච්ඡේදයක් සඳහා ලාභවලින් කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා ආදායම් බදු නිදහස ලැබේ.

එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජ්‍ය කටයුතු ආරම්භ කිරීමෙන් වසර පහකට (05) පසු, යන දෙකින් කලින් එළඹෙන දින සිට ආරම්භ වේ.

මින්මතු ඉහත සඳහන් බදු නිදහස් කාල පරිච්ඡේදයේ අවසාන දිනයට අනතුරුව එළඹෙන ඉක්බිති වසර (10)ක කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායමෙන් සියයට විසිපහ (25%) ක් අදාල වේ.

(ii) සමාගමේ උපරිම ප්‍රවාසික සේවකයින් සංඛ්‍යාව විස්ස (20) කට වසර පහ (5) ක කාලයකට උපයන විට ගෙවිය යුතු බදු නිදහස අදාල වනු ඇත.

(iii) දේශීය ආදායම් පනතේ කුමන හෝ ප්‍රතිපාදනයන් මත ප්‍රතිග්‍රාහකයා සම්පූර්ණයෙන්ම බදු ගෙවීමෙන් නිදහස් වන අතර පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වේ.

- ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය සඳහා ගෙවන පොළිය

- උපදේශකයින්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව

- කළමණාකාර ගාස්තුව දළ මෙහෙයුම ආදායම්වලින් සියයට තුනක (3%) ප්‍රමාණයක්

- පුරස්කාරක ගෙවීම් දළ මෙහෙයුම් ආදායම්වලින් සියයට එකයි දශම පහ (1.5%) ක ප්‍රමාණයක්

- අලෙවිකරණ ගෙවීම් දළ මෙහෙයුම් ආදායම් වලින් ආදායම්වලින් සියයට එකයි දශම පහ (1.5%) ක ප්‍රමාණයක්

(ආ) *2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (සංශෝධිත)*

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදී ගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කල අගය මත බදු ගෙවීමෙන් සම්පූර්ණයෙන් නිදහස් වේ. මෙම බදු සහනය ව්‍යාපෘතියට/ව්‍යාපෘති සමාගම වෙත සෘජුවම කරන සැපයුම් පමණක් නොව ව්‍යාපෘති සමාගම අනුමත කොන්ත්‍රාත්කරුවකු වෙත කරනු සැපයුම් සඳහා ද අදාල වේ.

(ඇ) *2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීමේ පනත (සංශෝධිත)*

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘති සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් තුළින් කරනු ලබන ආනයනයන් සඳහා වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම්වලින් සම්පූර්ණයෙන් නිදහස් වේ.

(ඈ) *2005 අංක 05 දරන මුදල් පනත*

ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වන වසර දහයක (10) ක කාලය තුළ ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම් සහ ගෙවීම් අදාල නොවනු ඇත.

**උපලේඛනය (සම්බන්ධිතයි)**

(ඉ) *2006 අංක 13 දරන ආර්ථික සංවර්ධන සේවා ගාස්තු බද්ද*

බදු සහන කාලය වසර අවසානය දක්වා 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු බද්ද ව්‍යාපෘති සමාගම සඳහා අදාල නොවේ.

(ඊ) *(235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත*

ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් වලට පමණක් ව්‍යාපෘති සමාගම නමින් ආනයනය කරනු ලබන අයිතමයන්/දේශීය වෙළෙඳ පොළෙන් මිලදී ගත හැකි ව්‍යාපෘතියට අදාල අයිතමයන් සහ ද්‍රව්‍ය රේගු බදු අයකිරීම් වලින් නිදහස් වේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන, පා. ම.,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

08-15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.